# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

BPU/ASS-02/17/07(II)

2021.07.30

## දැන්වීමයි.

## පීඨ ශිෂ්‍ය සංගම් නිලවරණය සඳහා නාමයෝජනා කැඳවීම - 2021

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2001 අංක 01 දරන ශිෂ්‍ය සංගම් නියෝග මාලාවේ අංක 07 ප්‍රකාර ව මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඒ ඒ පීඨයේ පීඨාධිපතිවරුන් පීඨ ශිෂ්‍ය සංගම් නිලවරණයේ නිලවරණ නිලධාරීන් ලෙස පත් කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**බෞද්ධ අධ්‍යයන පීඨය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉළුක්කේවෙල ධම්මරතන ස්වාමීන් වහන්සේ,
පීඨාධිපති - බෞද්ධ අධ්‍යයන පීඨය.

**භාෂා අධ්‍යයන පීඨය**

සහාය මහාචාර්ය පූජ්‍ය ලෙනගල සිරිනිවාස ස්වාමීන් වහන්සේ,
පීඨාධිපති - භාෂා අධ්‍යයන පීඨය.

බෞද්ධ අධ්‍යයන පීඨය හා භාෂා අධ්‍යයන පීඨය සඳහා එක් එක් පිය ශිෂ්‍ය සංගමය බැගින් පිහිටුවා ගැනීම පිණිස කෝවිඩ් - 19 වසංගත තත්ත්වය මත මාර්ගගත ව නාම යෝජනා කැඳවීම පහත සඳහන් පරිදි නිලවරණ නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ.

**බෞද්ධ අධ්‍යයන පීඨය**

| | | |
|---|---|---|
| දිනය | : | 2021 අගෝස්තු මස 18 දින |
| වේලාව | : | පෙ.ව. 10.30 සිට පෙ.ව. 11.00 දක්වා |
| ස්ථානය | : | බෞද්ධ අධ්‍යයන පීඨ කාර්යාලයේ දී |

**භාෂා අධ්‍යයන පියය**

| | | |
|---|---|---|
| දිනය | : | 2021 අගෝස්තු මස 18 දින |
| වේලාව | : | පෙ.ව. 11.00 සිට පෙ.ව. 11.30 දක්වා |
| ස්ථානය | : | භාෂා අධ්‍යයන පීඨ කාර්යාලයේ දී |

01. නාමයෝජනා ඉදිරිපත් කිරීම මෙහි ප්‍රදර්ශනය කර ඇති ආකෘති පත්‍රය අනුව සිදු කළ යුතුය. ආකෘති පත්‍රය විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් බාගත කර ගත යුතුය. අදාළ ආකෘති පත්‍රය පුරවා යෝජක හා ස්ථිර කරන්නාගේ අත්සන් ලබා ගෙන තිදෙනාගේ ම ශිෂ්‍ය වාර්තා පොතේ ශිෂ්‍යයාගේ නම සහ අත්සන සඳහන් පිටුවේ ඡායා පිටපත්

තුනක් (03) සමඟ 2021.08.18 දින පෙ.ව. 10.00 පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතුය.

**සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා),**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**ගුරුළුගෝමී මාවත,**
**පිටිපන උතුර,**
**හෝමාගම.**

එසේ එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි බෞද්ධ අධ්‍යයන පීඨයේ සිසුන් **''බෞද්ධ අධ්‍යයන පීඨ ශිෂ්‍ය සංගම් නිලවරණය - 2021''** යනුවෙන් සඳහන් කළ යුතුය. භාෂා අධ්‍යයන පීඨයේ සිසුන් **''භාෂා අධ්‍යයන පීඨ ශිෂ්‍ය සංගම් නිලවරණය - 2021''** යනුවෙන් සඳහන් කළ යුතුය.

තැපෑලේ දී සිදුවන ප්‍රමාදවීම් පිළිබඳ ව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.

02. පීඨ ශිෂ්‍ය සංගම් නිලවරණයේ දී නිලධාරියෙකු ලෙස හෝ සභිකයෙකු ලෙස ඉදිරිපත් වන අපේක්ෂකයෙකු ලෙස නම් කරනු ලැබීමට තම පීඨයේ ලියාපදිංචිය ලද සෑම ශිෂ්‍යයෙක් ම සුදුසුකම් ලබයි.

03. එක් පීඨ ශිෂ්‍ය සංගමයක් සඳහා පහත සඳහන් තනතුරුවලට අදාළ ව නිලධාරීන් තෝරා ගත යුතුය.

(අ) සභාපති
(ආ) උපසභාපති
(ඉ) ලේකම්
(ඊ) කණිෂ්ඨ භාණ්ඩාගාරික සහ
(උ) කාරක සභිකයන් 2

04. එක් ශිෂ්‍යයෙකුට අපේක්ෂකයෙකු වශයෙන් නම් කළ හැක්කේ නිලධාරි පදවියක් හෝ කාරක සභික පදවියක් හෝ සඳහා පමණි.

05. නාම යෝජනා පත්‍ර ආකෘති පත්‍රයේ සඳහන් ආකාරයට නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.

06. නාම යෝජනා පත්‍රය අපේක්ෂකයා විසින් හෝ යෝජකයා විසින් හෝ ස්ථිර කරන්නා විසින් ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

07. වර්තමානයේ රටේ පවතින කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මාර්ගගතව පීඨ ශිෂ්‍ය සංගම් විශේෂ නිලවරණය පවත්වන බැවින් මෙහි සඳහන් උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණහොත් එවැනි නාමයෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අපේක්ෂකයකුගේ නාම යෝජනා පත්‍රයට එරෙහි ව මතු දක්වෙන ඕනෑම කරුණක් හෝ ඒවා සියල්ල පිළිබඳ ව නිලවරණ නිලධාරියා වෙත විරෝධතා දැක්විය හැකිය.

I. නියෝග මාලාවේ 3 වැනි වගන්තිය ප්‍රකාර නිලවරණ පවත්වන අධ්‍යයන වර්ෂය සඳහා අදාළ පීඨයේ පූර්ණකාලීන ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි නොවූ ද,

ශිෂ්‍යභාවය අත්හිටුවනු ලැබුවාවූ ද විභාග අක්‍රමිකතා සඳහා මොනයම් හෝ දඬුවමක් ලැබුවාවූ ද, විශ්වවිද්‍යාලයෙන් ණය ගැති වූ හෝ එවැනි ණයක් ගෙවීමට විශ්වවිද්‍යාලය සමග ලිඛිත එකගත්වයකට හෝ නොපැමිණියාවූ ද සිසුන්,

II. යෝජකයා හා ස්ථිර කරන්නා පීඨයේ ලියාපදිංචි උපාධි අපේක්ෂකයකු නොවීම.

III. යෝජකයා හා ස්ථිර කරන්නා නාමයෝජනා පත්‍රයෙහි ඔහුගේ අත්සන නොතැබීම.

IV. නාමයෝජනා පත්‍රය මෙම නියෝගයේ විධිවිධානයන්ට අනුකූල නොවීම.

V. අපේක්ෂකයා පීඨයෙන් හෝ විශ්වවිද්‍යාලයෙන් තහනම් නියෝගයකට යටත් ව සිටීම.

09. මෙම දැන්වීම මාර්ගගතව නාම යෝජනා කැඳවීම සඳහා සුදුසු පරිදි නැවත සකස් කරන ලද්දකි.

10. මීට අමතර ව 2001 අංක 01 දරන ශිෂ්‍ය සංගම් නියෝග මාලාවේ සඳහන් සියලු නියෝග බලපැවැත්වෙන බව ද තවදුරටත් දන්වමි.

ලේඛකාධිකාරි

පිටපත් :
01. ගෞරවාර්හ මහෝපාධ්‍යායයන් වහන්සේ (ධුරයේ කාර්යයන් ඉටු කරන) - දූ.ගැ.ස.
02. නිලවරණ නිලධාරී (බෞද්ධ අධ්‍යයන පීඨය/භාෂා අධ්‍යයන පීඨය) - අ.ක.ස.
03. සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා) - දූ.ගැ.ස./අ.ක.ස.
04. සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන කටයුතු) - දූ.ගැ.ස./අ.ක.ස.
05. නේවාසිකාගාර උපපාලක (A,B,C / D,E,F /සරසවි මැදුර) - දූ.ගැ.ස./අ.ක.ස.